

2020 OCTOBER

BRAND NEW 2ND EDITION

# TESTRUN®
## MAGAZINE

PRICE: LKR. 100/-

ඔබ දැනගත යුතු නවතම රථය
## 2021 LAND ROVER
# DEFENDER

ලංකාවේ මුල්ම
Full luminous Sticker
සහිත බස් අනුරුව

වෘත්තීය නිපුණත්වයේ
බිහිදොර
## CGTTI
CEYLON - GERMAN TECHNICAL
TRAINING INSTITUTE

ඇව්රෝ ගුවන්යානා
සමාගම ගොඩගත්
## Prof. Selvadurai Mahalingam

EXPAND YOUR DESIRE FOR AUTOMOBILES...


1988 -
YOUR LIFE IS
PRECIOUS TO US
PUT ON SEAT BELT
TESTRUN


AUTO ZONE
AUTOZONE.LK
සිද්දමුල්ල, කොට්ටාව.
0767060956 / 0766110798
රෝද '2'ට
DEAL එකක්!
යතුරුපැදි විකිණීම
යතුරුපැදි මිලදී ගැනීම
යතුරුපැදි හුවමාරුව
FZ (2015)
RS - 220,000/=
DIO (2017)
RS - 200,000/=
CT100 (2014)
RS - 110,000/=
ADDRESS - 130A1, SIDDAMULLA, PILLIYANDALA



# DIRECTOR'S LETTER



**Nilantha Anuradha**
Editorial Director

Transportation is one of the most important needs for us living in a run-down world. When it comes to transportation, vehicles are the main resource. People who have a car, people who love cars, and people who are looking for a vehicle are all having the same interest towards automobiles. We know that you're one of them as well. If you are a car enthusiast, it'll be much easier & much comfortable if you could read about everything in one place. And nowadays we see the same information about automobiles that are on the internet. There are many aspects of the transportation industry that most of us are unaware of. Testrun magazine is created, designed to bring you closer & familiar to you.

This week's/month's edition is all about products & designs in the automotive industry in Sri Lanka. You will be eligible to read everything related to the automotive industry in Sri Lanka and around the world.

Testrun magazine is a magazine that everyone & anyone can read in spite of the area you live in. And in areas where the technology is less advanced, you are welcome to inform us if you want to learn about automobiles. We are prepared to devise a special program for that.

We also invite anyone who would like to work with the magazine. Don't forget to send us your thoughts, accusations and suggestions. So here is another link in the Testrun chain called Testrun magazine that will be distributed to you as an online magazine.

**Supporting Roles:**

SWAN research and analysis online company

CHAMELEONSHADE

**Subscribe Now:** https://www.youtube.com/testrunsl
**Like Now:** https://www.facebook.com/testrun.lk
**Follow Now:** https://www.instagram.com/testrun.lk
**Follow Now:** https://twitter.com/testrunlk


KIDZ BUZ
2.4G 4CH ROCK
CRAWLERS DRIVING
CAR DRIVE
VISIT FOR THE MORE DETAILS
www.kidzbuz.com




# Why was Concorde's Cockpit so complex?

Send us your answer





# CONTENTS

**Page 12**

ඇව්රෝ ගුවන්යානා සමාගම ගොඩගත්

**Prof. Selvadurai Mahalingam**

**Page 16**

ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ

**Formula Buggy**

**Page 22**

ලංකාවේ මුල්ම Full luminous Sticker සහිත බස් අනුරුව

**Page 38**

ඔබ දැනගත යුතු නවතම රථය

**2021 Land Rover Defender**

**Page 66**

හයිඩ්‍රජන් විප්ලවයකට උරදෙමින් වෙළෙඳ පොළට එන

**Hyperion XP-1**

**Page 80**

ටයිටැනික් නැව ගිලුණේ අයිස් කන්දක හැපිලද? සූර්යය කුණාටුවකින්ද?

**Page 90**

දැවැන්ත රේසිං ක්‍රීඩා මාලා දෙකක නිල නාමය: FORZA

ඇව්රෝ ගුවන්යානා සමාගම ගොඩගත්

# Prof. Selvadurai Mahalingam

S.Sameera

**එකල ලෝ ප්‍රකට ඇව්රෝ සමාගමේ ගුවන්යානා එන්ජිම්වල දෝෂයක් හට ගැනුණි. මේ නිසා "ඇව්රෝ" ගුවන්යානා නිෂ්පාදන සමාගම දැවැන්ත අර්බුදයකට මුහුණ දුන්නේය. එනම් සිය ඇව්රෝ ජෙට් ඇංජිමේ ඇතිවන දෙදරීම හේතුවෙනි. මෙම දෝෂය නිසා සිය අලෙවියද පහල වැටුණි. මෙම දෝෂය සොයා ගැනීමට අති දක්ෂ යාන්ත්‍රික ඉංජිනේරුවන්ගෙන් යුක්ත වූ ඇව්රෝ සමාගමට නොහැකි විය. මෙම ගැටලුව ඇව්රෝ සමාගමෙන් එළියට ගියේ ලෝකයෙන් උපකාර පතාය. ශ්‍රී ලංකාවේ පේරාදෙණිය සරසවියේ ආචාර්යවරයකු වූ මහාලිංගම් මහතා ඊට ඉදිරිපත් විය.**

මහාචාර්ය සෙල්වදුරෙයි මහාලිංගම් එසේත් නැත්නම් එස්. මහාලිංගම් කියූවිට වර්තමානයේ දරු දැරියන්ට එතරම් හුරුපුරුදු නමක් නොවෙයි. නමුත් පාසල් පෙළ පොත්වලට පවා එක්කල යුතු යුග පුරුෂයෙකි. කෙටියෙන්ම කියනවානම් ශ්‍රී ලංකාවේ පමණක් නොව දෙස්විදෙස් හි පතාක ඉංජිනේරුවරයෙකි. මෙසේ කියන විට ඇතැමුන්ට මොහු ගැන මතකයට නැගෙනු ඇත. දන්නා අයට සිහිපත්වීමටත් නොදන්නා අයට දැනගැනීමටත් එස්. මහාලිංගම් මහතා ගැන කියන්න කෙටියෙන් මතක්කර දෙන්නම්.

1926 ජනවාරි 16 වැනිදා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ අලවෙඩ්ඩි ප්‍රදේශයේ මොහු උපත ලබනවා. මෙහුගේ පියා සෙල්වදුරෙයි වන අතර මව නාගම්මා සෙල්ලසරස්වතී වෙයි. තරුණවියට එළඹෙත්ම ඔවුන් මලය රටට පදිංචියට ගියේය. මැක්ස්වෙල් පාසලෙන් හා වික්ටෝරියා පාසලෙන් අධ්‍යාපනය ලැබූ මොහු අවුරුදු 20 වනවිට නැවතත් ශ්‍රී ලංකාවට පැමිණෙයි.









1946 දී ඔහු Ceylon Technical Collegeයට සම්බන්ධ වී B.Sc.Eng. (Bachelor of Engineering) උපාධිය ලබාගත්තේය. ඉන් පසු ඔහු එංගලන්තයේ ෂෙෆ්ෆීල්ඩ් විශ්වවිද්‍යාලයෙන් Ph.D උපාධිය ලබාගත්තේය. අනතුරුව ඔහු දේවකී සමග විවාහ දිවියට එළැඹෙයි.

යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය ලැබ පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග සම්බන්ධ වෙමින් ඉංජිනේරු පීඨයේ සේවයේ නිරත විය.

"ඇව්රෝ" ගුවන්යානා නිෂ්පාදන සමාගමේ දෙදරීමට අපේ යාන්ත්‍රික ඉංජිනේරු මහාචාර්ය මහාලිංගම් මහතා පිළියමක් සොයා ගත්තේය. ඒ සිය අති දක්ෂ යාන්ත්‍රික ඉංජිනේරුවන්වන් මෙන්ම ලෝකයක්ම මවිත කරවමිණි. අවාසනාවට මෙවන් පුද්ගලයන් ගැන අද අසන්නට නොලැබෙයි. දෝෂයට පිළියම් සොයාගැනීම හේතුවෙන් මහාලිංගම් මහතා වෙත විශාල මුදල් කන්දරාවක්, ඇව්රෝ සමාගමේ ඉහළම තනතුරක්, යාන වාහන,



එක්සත් රාජධානියේ පුරවැසිභාවය වැනි වරප්‍රසාද ගණනාවක් මහාලිංගම් මහතාට හිමිවිය. ඒ සියල්ල ප්‍රතික්ෂේප කළ එතුමා ඉල්ලා සිටියේ ඉල්ලා සිටියේ එක් දෙයක් පමණි. ඒ තමා ජීවත්වන රටේ ඉංජිනේරු පීඨයේ සිසු සිසුවියන්ට තාක්ෂණය ගැන ඉගෙන ගත හැකි ආකාරයේ ජෙට් යානා එන්ජිමකි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු පීඨයට ගොඩවැදුණුවිට ඉංජිනේරු පීඨයේ පෝටිකෝව තුළින්, එහි ආලින්දයට ගොඩවූ විගසින්ම දක්නට ලැබෙන්නේ එක්සත් රාජධානියේ ඇව්රෝ සමාගමෙන් මහාචාර්ය මහාලිංගම්ට ලැබුණු ජෙට් ඇංජිමයි.

ඇව්රෝ ගුවන්යානා සමාගම බේරාගනිමින් ලෝකයක් මවිත කළ මෙම නිහඬ චරිතය 2015 නොවැම්බර් 3 වැනිදා ලෝකයෙන් සමුගත්තේය.

# ලංකාවේ නිර්මාණය වූ Formula Buggy

Kalum V. Sampath

**මීට දශක කිහිපයකට පෙර ලංකාවේ අපේ මාර්ගවල ධාවනය කළ හැකි වාහන නිෂ්පාදනය කර ඇති බව ඇතැම් අය නොදන්නවා ඇති. මේ වනවිට ලංකාවේ වාහන නිෂ්පාදනය නැවතී තිබුණත් වාහන පිළිබඳව අධ්‍යනය කරන සිසුන් විවිධ පරේයශණ නිර්මාණ බිහි කරනවා විටින් විට දක්නට ලැබෙනවා. වාහනවලට තිබෙන ආසාව හේතුවෙන්ම Formula Buggy වර්ගයේ කාර් රථයක් තනිවම නිර්මාණය කළ තරුණයෙක් අපට හමුවුණා.**




Levi's



## ඔබ කවුද?

මම ඉසුරු චතුරංග. වයස 22යි. පදිංචි වෙලා ඉන්නේ ඇඹිලිපිටිය. මම ඔටෝ මොබයිල් අංශයේ NVQ Leval 4 දක්වා හදාරා තිබෙනවා.

## මේ රථය නිර්මාණය කරන්න අදහස එන්නේ?

මම ඔටෝමොබයිල් ඉගෙනගනිද්දි අපේ ටෙක් එකේ ප්‍රදර්ශනයකට අපේ වැඩිමහල් අයියලා පොඩි වාහනයක් හදලා තිබුණා. ඒක දැකලා මමත් ඒ වගේ පොඩි වාහනයක් හැදුවා. මේ Formula කාර් එක හදන්න පටන් ගන්නේ ඊටපස්සේ. මේ මම හදපු දෙවැනි වාහනය. මාතරදී අවුරුද්දදකට සැරයක් පවත්වන වාහන රේස් එකක් පවත්වනවා. ඒ රේස් එකට ෆෝමියුලා වර්ගයේ කාර් ගෙනාවා. ඒක බලන්න ගිය වෙලාවක ඒ තිබුණු ෆෝමියුලා කාර් දැකලා ඒ වගේ එකක් හදන්න ආසාවක් ඇතිවුණා. එහෙම තමයි මේක නිර්මාණය කරන්නේ.

## Formula buggy ගැන විස්තර කිව්වොත්?

Formula buggy රථය හදලා ඉවර කරන්න අවුරුද්දක් විතර ගියා. මොකද මගේ අධ්‍යාපන කටයුතුත් එක්ක හැමතිස්සේම මේකත් එක්ක









ඉන්න අමාරුයිනේ. මම මේකට යොදාගෙන තියෙන්නේ 125CC මෝටර් බයිසිකල් එන්ජිමක්. ඒ වගේම මේ කාර් එක මැනුවල්. සාමාන්‍ය මැනුවල් වාහනයක වගේම බ්‍රේක්, ඇස්ලේටර්, ක්ලච් කකුලෙන් පාගන්න පුළුවන් විදිහට හදලා තියෙන්නේ. එතකොට හරවන්න ස්ටීරියන් රැක් එකක් තියලා තියෙන්නේ. මේකේ ස්ටීරියන් ඈන්ගල් හදලා තියෙන්නේ වංගුවක් හැරවූවාම ආයෙත් ඉබේම කෙලින් අතට හැරවෙන විදිහට. අතින් තමයි ගියර් මාරු කරන්න තියෙන්නේ.

පිටිපස්ස රෝද දෙකෙන් තමයි ධාවනය වෙන්නේ. ඉන්ධන විදිහට භාවිතා කරන්නේ පෙට්‍රෝල්. මේක පැයට කිලෝමීටර් 70ක වේගයකින් ධාවනය කරන්න පුළුවන්. මම විශ්වාස කරනවා ඊට වඩා වැඩි වේගයක් මේකට ගන්න පුළුවන්



CREATIVITY

# ලංකාවේ මුල්ම Full luminous Sticker සහිත බස් අනුරුව










Ajith S. Prasann

බස් රථවලට ආදරේ කරන බොහෝ දෙනෙක් අපිට නිතරම හමුවෙනවා. ඇතැමුන්ට ආදරේටත් එහා ගිය ආධ්‍යාත්මික බැඳීමක් මේ බස් එක්ක තියෙනවා කිව්වොත් හරි. ඔවුන් නිසා තමයි ලංකාවේ බස් කර්මාන්තය ලස්සන වෙන්නේ. එවන් තරුණයෙක් ගැන පසුගිය දා අපි testrun හරහා ගෙන ආවා. බස් රථ සිය ජීවිතය කරගත් තවත් කෙනෙක් අපට හමුවුණා. ඔහු තණමල්විල කොල්ලෙක්. මේ බස් රථය ගැන කතා කරන්න විශේෂ කරුණු කිහිපයක් මූලික වුණා. අපි බලමු ඔහුගෙන්ම අහලා මේ බස් අනුරුව මොකක්ද කියලා.

- **නම:** කේ. ලහිරු මධුෂ දිල්ශාන්
- **ගම:** තණමල්විල, කුඩාඔය



## ඔබ ගැන කතා කළොත්?

මම ලහිරු දිල්ශාන්, ඉන්නේ තණමල්විල. රැකියාව ලෙස කරන්නේ බස් රථ ධාවනයයි.

## ඇයි මෙහෙම අනුරුවක් නිර්මාණය කරන්න හිතුවේ?

කලින් මේ වගේ නිර්මාණ කරලා නැහැ. හැබැයි බස්වලට තියෙන කැමැත්ත නිසා තමයි මේ වගේ බස් අනුරුවක් නිර්මාණය කරන්න හිතුවේ.









## මොකක්ද මේ බස් අනුරුව?

ලංකාවේ බොහෝ දෙනෙකු දන්න කියන බස් එකක් තමයි දුඹුරු ළමිස්සී කියන්නේ. මේ තියෙන්නේ ඒ බස් එක වගේ අනුරුවක්. මේ අනුරුව තමයි ලංකාවේ මුල්ම වරට full Lumines sticker එකක් ගහලා බස් අනුරුවක් නිර්මාණය කළේ. ඒ වගේ බස් අනුරුවක් මුල්ම වරට ලංකාවේ සිදුකරන්න වුණ එක ගැන මම සතුටු වෙනවා.

## මේ බස් අනුරුවේ තියෙන විශේෂත්වය මොකක්ද?

ශ්‍රී ලංකාවේ හොඳටම මොඩිෆයි කරපු බස් අනුරුව මේක කිව්වොත් මම හරි කියලා හිතනවා. මේ බස් එක ඇතුළේ seat lights system, outdoor sound system වැනි මොඩිෆයි කරපු බස් එකක තියෙන සේරම අංග මේ බස් අනුරුව ඇතුළෙත් තියෙනවා.

## කොච්චර කාලයක් ගියාද මේ අනුව හදන්න?

සම්පූර්ණයෙන්ම වැඩ ඉවර කරන්න මාස 10ක් වගේ කාලයක් ගියා.

## උදවු කළ අය මතක් කළොත්?

අම්මයි, තාත්තයි සල්ලිවලින් උදවු කළා. තව මගේ යාලුවොත් උදව් කලා. එතකොට මේකේ ස්ටිකර් හදන්න උදවු කළා නාලක අයියා.

## ඉදිරියේදී මොනවද බලාපොරොත්තු?

මේ වගේ බස් එකක් ගන්න එක තමයි මගේ බලාපොරොත්තුව. තව මේ වගේ බස් අනුරුත් ඉස්සරහට හදන්න බලාපොරොත්තු වෙනවා.

0785339873




FEATURE

# මොනාද මේ
# LOW-FLOOR BUS




Ajith S. Prasanna

**ඔබ නිනමටවත් හිතුවද ඇයි ශ්‍රී ලංකාවේ තියෙන බස් එකකට පඩි 4ක් නැගලා ගොඩවෙන්න තියෙන්නේ කියලා. නැහැ නේද? හැබැයි වෙනත් රටවල තියෙන බස්වල උපරිම පඩි 2ක් වගේ තමයි නගින්න තියෙන්නේ. ඒ කියන්නේ ලොරි වැසියට, බස් බොඩිය ගහන කතාව ඇත්ත වෙනවා. ලොරිවලට තමයි පඩි නැගලා යන්න තියෙන්නේ. බස් එකකට ලොරි වැසිය නොගැල පෙන බව විටින් විට සමාජයේ මතුවන කාරණයක්. ඒ නිසා තමයි low-floor bus මෙරට භාවිතයට හුරුකරන්න කියලා කියන්නේ. ඇතැම් බස් හිමියන් මේ කරුණ හා එකඟ නොවන්න පුළුවන්. මක් නිසාද යත් low-floor bus එකට වඩා ලොරි වැසිය ඔවුන්ට වාසි දායන නිසා. ඒ දේවල් වෙනමම කතාකරන්න ඕන මාතෘකා. ඒ නිසා ඒවා පැත්තකින් තියලා low-floor bus ගැන ටිකක් කතා කරමු.**

බස් රථයට නැගීමට ඇති පඩිය, පොළව හා අඩු උසකින් පැවතීම මෙහි විශේෂත්වයයි. ආබාධිත පුද්ගලයෙකුට මෙන්ම ඕනෑම කෙනෙකුට පහසුවෙන් බසයට ගොඩවිය හැකිය. ඒ විතරක් නොව රෝද පුටු හා අත්වාරු භාවිත කරන පුද්ගලයන්ටද පහසුවකි. බස් රථයේ සැකැස්ම ගැන සැලකීමේදී එන්ජිම රථය පිටුපස ස්ථාන ගත කර තිබේ. ඒ කියන්නේ මේ රථවල තිබෙන්නේ RR සිස්ටම් එකක්. එනම් rear-engine, rear-wheel-drive layout එකක්. මේ නිසා drive shaft එකක් දක්නට ලැබෙන්නේ නෑ. ඊට අමතරව මෙම බස්රථ නිෂ්පාදන සමාගම් independent front suspension පද්ධතියක් බස් රථ සඳහා යොදා ගනියි.



## වෘත්තීය නිපුණත්වයේ බිහිදොර

# ලංකා-ජර්මන් කාර්මික ආයතනය

## CEYLON – GERMAN TECHNICAL TRAINING INSTITUTE (CGTTI)






වර්තමානයේදී බොහෝ දෙනෙකු මෝටර් රථ ක්ෂේත්‍රයේ ඉදිරියට යෑමට බලාපොරොත්තු ඔබ බලාපොරොත්තු වන බව අපි දන්නවා. එසේ ඉදිරියට යන පුද්ගලයෙකුට කදිම තෝතැන්නක් තමයි CGTTI .. එහෙමත් නැත්නම් ලංකා-ජර්මන් කාර්මික ආයතනය. "ජර්මන් ටෙක්"කියා තමයි බොහෝ දෙනෙක් කෙටියෙන් කියන්නෙ. වාහන ක්ෂේත්‍රයේ නම් දරාපු පිරිස් රැසක් එළියට එන ලංකා-ජර්මන් කාර්මික ආයතනයේ පාඨමාලාවක් හැදෑරීම වෘත්තීය සුදුසුකමක් ලෙස වර්තමානයේ සලකනවා.

පාඨමාලාවක් තෝරාගැනීමේදී අදවනවිට බොහෝ දෙනෙකුට මතුවන ගැටලුවක් තමයි NVQ Level එක. ජර්මන් ටෙක් එකේ NVQ Level 5 මට්ටමත් තිබෙනවා. ශ්‍රී ලංකාවේ මෝටර් කාර්මික ක්ෂේත්‍රය සඳහා වූ විශිෂ්ටතම පුහුණු මධ්‍යස්ථානයක් ලෙස අවශ්‍ය සම්මත පවත්වා ගනිමින්, මෝටර් කාර්මික හා ඊට අදාළ වෘත්තීන් සඳහා ක්‍රමානුකූල ලෙස සංවර්ධනය වූ තාක්ෂණයෙන්, පුහුණුවන්නන් සඳහා ඉහළ මට්ටමේ කාර්ය සාධනයට ළඟාවීමට අදාළව සැකසුණු නවීන පුහුණුව සපයන මෙම ආයතනය මෝටර් රථ ක්ෂේත්‍රයේ ජනප්‍රියම නාමයක්.



ඒ නිසා ජර්මන් ටෙක් ආයතනය දකුණු ආසියාවේ විශිෂ්ටතම මෝටර් කාර්මික අභ්‍යාස ආයතනය බවට පත්වී තිබෙනවා.

1959 වසරේදී ජර්මන් රජය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් ගිවිසුමක ප්‍රතිඵලයකින් තමයි මේ ආයතනය බිහිවෙන්නෙ. ඒ අවුරුද්දෙම ලංකා ගමනාගමන මණ්ඩලයේ (ලං.ග.ම.) වේරහැර මධ්‍යම වැඩපොලට අයත් පරිශ්‍රයේදී තමයි මුලින්ම ආරම්භ කරන්නෙත්. මුල් කාලයේ ලං.ග.ම. බස්රථ හදන්නත්, අලුත්වැඩියා කරන්නත් අවශ්‍ය කාර්මිකයන් පුහුණු කිරීම තමයි මේ





ආයතයේ ප්‍රධාන අරමුණ වුණේ. නමුත් පසුකාලයේදී ශ්‍රී ලංකාවේ මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා ඊට අදාළ අනෙකුත් ක්ෂේත්‍රවල දක්ෂ, නිපුණ කාර්මික පිරිසක් මෙම ආයතනයෙන් ශ්‍රී ලංකාවට දායාද කරනවා. ඔන්න ඔහොමයි ආයතනය ආරම්භ වුණේ.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) පුහුණු වැඩපිළිවෙල යටතේ පූර්ණ කාලීන පාඨමාලා පහත ක්ෂේත්‍රයන් ආවරණය කරන අතර එක් එක් පාඨමාලා හා කාලසීමාව පහත දැක්වෙයි.

- මෝටර් කාර්මික ශිල්පී - වසර 4
- යනත්‍රෝපකරණ වැද්දුම් ශිල්පී (මිල්රයිට්) - වසර 4
- බල විදුලි ශිල්පී (නඩත්තු) - වසර 3
- ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී - වසර 3
- යන්ත්‍රන ශිල්පී (සාමාන්‍ය) - වසර 3
- මෙකාට්රොනික් (කර්මාන්ත) ශිල්පය - වසර 3
- ඩීසල් එන්ජින් කාර්මික ශිල්පී - වසර 3
- වාහන විදුලි ශිල්පී - වසර 3
- වාහන වායු සමීකරණ ශිල්පී - වසර 3
- පෑස්සුම් ශිල්පී - වසර 3
- මෝටර් වාහන බොඩි අළුත්වැඩියා සහ පින්තාරු ශිල්පී - වසර 3

මේ පුහුණු පාඨමාලා සේරම වගේ කර්මාන්තශාලා සහ විද්‍යාගාර තුල 80% ක ප්‍රායෝගික පුහුණුවකින්ද පන්තිකාමර තුළ 20% ක සෛද්ධාන්තික පුහුණුවකින්ද යුක්තයි . සියලුම පූර්ණකාලීන පාඨමාලා වසර 3 සිට වසර 4ක කාල සීමාවක් සඳහාය.

පෞද්ගලික අංශයේ සේවකයන්ට සහ පාසල් හැරගිය අයට අර්ධ කාලින පුහුණු යෝජනාක්‍රමය, අමතර පුහුණු ක්‍රියාකාරකමක් ලෙස සාමාන්‍ය රාජකාරී කාලයට අමතර වේලාවන්හිදී ක්‍රියාත්මක කරනවා. මෙම යෝජනා ක්‍රමය යටතේ කෙටිකාලීන පාඨමාලා 37 ක් සවස් කාලයේ සහ සති අන්තයේ පැවැත්වෙනවා.

මෙහි විශේෂ පාඨමාලා කිහිපයක්ද තියෙනවා. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් පාරිභෝගික අවශ්‍යතා අනුව සකස් කරන ලද දිවාකාල විශේෂ පුහුණු පාඨමාලා පවත්වනවා. පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සංවිධාන ඔවුන්ගේ තාක්ෂණික කාර්ය මණ්ඩලය මෙම වැඩසටහන් මගින් පුහුණු කරවනවා.

## අවසන් පරීක්ෂණය

පුහුණු කාලසීමාව අවසානයේ පූර්ණ කාලීන සිසුන් අවසාන වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිනවා. ඇගයීම් සහ පරීක්ෂණ කිරීම ලං.ජ.කා.අ.ආ. මගින් හා NAITA ආයතන මගින් සිදු කරනු ලබන අතර නියමිත රෙගුලාසිවලට අනුව මෙම ආයතන 2 මගින් සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදුකරනවා. අර්ධ කාලීන පාඨමාලාවන්හි පුහුණුවන්නන්ට ඔවුන්ගේ පාඨමාලා අවසානයේ ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා, ඉන් සමත්වන්නන්ට සහතික පත්‍ර ප්‍රදානය කරනවා.

***වැඩිවිස්තර, 011 260 5625 හා 011 260 5535 යන දුරකථන අංකවලින් ලබාගත හැකියි.***



# ඔබ දැනගත යුතු නවතම රථය

## 2021 LAND ROVER

# DEFENDER

පසුගිය දිනවල ශ්‍රී ලංකාවේ නවතම ඩිෆෙන්ඩර් රථයක් දක්නට ලැබුණා. හුරුබුහුටි හැඩයකින් යුක්ත එය පෙනුමෙන් මුල් ඩිෆෙන්ඩර් රථයේ DNA වලට නෑදෑකම්ද කියනු ලැබුවා. නවීන තාක්ෂණික අංග රැසක් එහි ගැබ්වී තිබූ අතර, ආකර්ශණීය පෙනුම කාගේත් සිත් ඇද බැඳ ගැනීමට සමත් වුණා. බොහෝ පිරිසකගේ ආකර්ශනය දිනාගත් ඩිෆෙන්ඩර් රථය ගැනයි මේ...


DEFENDER







Dilhan Dhanushka

මෙම 2021 ඩිෆෙන්ඩර් රථය මාදිලි 2කින් වෙළෙඳ පොළට නිකුත් කර තිබෙනවා. එනම්,

- DEFENDER 90
- DEFENDER 110

ඇතැම් මාදිලි වෙනස් වන්නේ එහි ඇති විශේෂාංග හා ආසන ප්‍රමාණය හා ආසන ප්‍රමාණය අනුවය. ප්‍රධාන වශයෙන් මෙම මාදිලි පෙළෙහි කැපී පෙනෙන්නේ 90 හා 110 මාදිලියි. මෙම මාදිලි දෙක කැපී පෙනෙන විශේෂත්වයකින් යුක්ත වෙයි.

## DEFENDER 90 හා DEFENDER 110

Off හා On-road සඳහා විශේෂඥයෙකු වූ මෙම මෝටර් රථ සැලකෙයි. මෙම ඩිෆෙන්ඩර් මාදිලිත් වර්ග 6කින් දැකගත හැකි වෙයි. එනම්, Defender, S, SE, HSE, First Edition හා Defender X ලෙස. DEFENDER 90 ප්‍රමාණයෙන් කුඩා වන අතර, DEFENDER 110 ප්‍රමාණයෙන් විශාල වෙයි.

දිගුකල් පවත්නා අමුද්‍රව්‍ය වලින් අභ්‍යන්තරය නිර්මානය කර තිබේ. රථය තුළ සැකැස්ම යන මගීන් ප්‍රමාණය හා භාණ්ඩ රැගෙන යෑමේ ප්‍රමුඛත්වය අනුව සකසා ගත හැකිය. උදාහරණයක් ලෙස ගන්නේ නම්,

වැඩි භාණ්ඩ ප්‍රමාණයක් හා පුද්ගලයන් 3 දෙනෙකු පමණක් ගමන් කරන්නේ නම් ඔබට DEFENDER 90 රථය මිලදී ගත හැකිය. එම රථය මගීන් 4 දක්වා උපරිමයකට යටත්ව විශාල භාණ්ඩ ප්‍රමාණයක් සමග ධාවනය කළ හැකිය.

DEFENDER 110 මාදිලිය මගීන් 7 දෙනෙකු පමණක් දක්වා උපරිමයකට ගමන් කළ හැකි අතර පිටුපස ආසනය එනම් 3 වැනි පේළියේද මගීන් 2 දෙනෙකුට (5+2 ආසන සැකැස්ම) පහසුවෙන් ගමන් කළ හැකිය. මගීන් ප්‍රමාණය 5ක් හා විශාල ගමන් මලු ප්‍රමාණයක් සමග ගමන් කිරීමේ හැකියාව පවතියි. මේ සෑම දෙයක්ම ඔබේ අවශ්‍යතාව අනුව සකසා ගත හැකිය.











Crystal-Clear, full-color high-resolution graphics සහිත Head-up Display එකකින් යුක්ත අතර එහි speed, gear position හා navigation directions වැනි දත්ත පෙන්නුම් කරයි. තවද මෙම අඟල් 12.3ක high-definition Interactive Driver Display එක මගින් 3D map-view navigation, phone හා media සඳහා සහාය දක්වයි. තවද මෙහි ඔබ කැමතිම ස්ථාන Save කර තබාගැනීම හා swipe හෝ pinch-to-zoom gestures පහසුකම simple map exploration සඳහා යොදා ගත හැකිය.








මීට අමතරව, Smartphone Pack, Wireless Device Charging, Software Updates හා Secure Tracker වැනි Connectivity පහසුකම් රැසකින් යුක්ත වෙයි. ස්මාට් දුරකථනය මෝටර රථය හා සම්බන්ධ විය හැකි අතර එමගින්, Remote Lock/Unlock, Remote Climate, Beep/Flash, Journey Tracking, Vehicle Status Check, Land Rover Optimised Assistance හා SOS Emergency Call විශේෂාංග ස්මාට් දුරකඛනය ඔස්සේ ලබාගත හැකිය.





*1948 අප්‍රේල් මාසයේදී Land Rover series මුල්වරට  Amsterdam Motor Show හිදී ප්‍රදර්ශණය කරනු ලැබීය. දෙවැනි ලෝක යුද්ධ කාලයේදී යුධ කටයුතු සඳහාද මෙය යොදා ගැනීම හේතුවෙන් විශාල ප්‍රසිද්ධියක් ඩිෆෙන්ඩර් සඳහා හිමිවිය. එදා සිට අද දක්වා විවිධ යුධමය කටයුතු, රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා ඩිෆෙන්ඩර් යොදා ගන්නේ අතීතයේ එම මෝටර රථය යොදාපු ශක්තිමත් අත්තිවාරම නිසාය.*







ඊට අදාල මෘදුකාංගය App Store හා Google Play Store හරහා Download කරගත හැකිය.

ධාවනයේදී DRIVER ASSISTANCE පහසුකම මගින් A comprehensive system of six airbags, Emergency Braking, Cruise Control හා Speed Limiter, Lane Keep Assist, Wade Sensing, Traffic Sign Recognition, 3D Surround Camera මෙන්ම Driver Condition Monitor පහසුකම් අත්කර දී තිබේ.

Off-Road සඳහා යෝග්‍ය රථයක් වන මෙය මිලදී ගැනීමේදී , Chequer Body Protection Kit, Inflatable Waterproof Awning, Deployable Side Steps, Integrated Air Compressor, Luxury Carpet Mats, Illuminated Treadplates හා Seat Coversද ලබාගත හැකිය.

පෙට්‍රල් හා ඩීසල් මාදිලි වලින්ද යුක්ත මෙය වර්ග අනුව විශේෂාංග වෙනස් වෙයි. මේ නිසා ඔබේ රුචිකත්වය අනුව ඔබට ගැලපෙන රථය නිර්මාණය කර ගැනීමේ හැකියාව Land-Rover සමාගම ඉඩ සලසා දී තිබේ.





# 4X4 VS 4WD

1893 දී, එනම් වර්තමාන මෝටර් රථ කර්මාන්තය ආරම්භවීමට ප්‍රථම එන්ගලන්තයේ Bramah Joseph Diplock නම් ඉංග්‍රීසි ජාතික නවනිපැයුම්කරුවා විසින් four-wheel-drive පද්ධතියක් නිර්මාණය කරනවා. එය වාෂ්පබලයෙන් ක්‍රියාකරන අතර four-wheel steering හා Differential 3ක් සහිත Traction engine එකකින් සන්නද්ධයි.





ඉන් පසු 1899දී පමණ Ferdinand Porsche විසින් four-wheel-driven විද්‍යුත් මෝටර් රථයක් k.u.k. Hofwagenfabrik Ludwig Lohner " Co. සඳහා නිර්මාණය කරන අතර, එය Lohner-Porsche ලෙස හැඳින්වෙයි. නමුත් මෙය මුල්ම four-wheel-driven රථය ලෙස සලකන්නේ නැහැ. 1903 දී Spyker 60 H.P., අභ්‍යන්තර දහන එන්ජිමක් සහිත මුල්ම four-wheel-drive මෝටර් රථය බවට පත්වෙනවා. එය නිර්මාණය වන්නේ Jacobus හා Hendrik-Jan නම් ලන්දේසි සහෝදරවරුන් දෙදෙනෙකු අතිනි.





1926දී පමණ ලොව ජනප්‍රිය Mercedes හා BMW සමාගම් 4WD මෝටර් රථ නිෂ්පාදනයට අතපොවනවා. ඉන්පසු සමාගම් රැසක් ඔවුන්ටම ආවේණිකවූ ලක්ෂණ සහිත 4X4 මාදිලි නිෂ්පාදනයට පියවර ගන්නා අතර, 4WD වාහන මිලදී ගන්නා ප්‍රධාන ගැණුම්කරුවා බවට ඔස්ට්‍රේලියාවට පෙරමුණ හිමිවෙනවා.

මෙම තාක්ෂණය විවිධ ක්‍රියාකාරකම් සඳහා අද වනවිට යොදාගනියි. Spyker නම් මුල්වරට නිෂ්පාදනය කළ four-wheel drive ධාවන මෝටර් රථය ධාවන තරඟ සඳහාද යොදාගත් අතර, ඉන් පසු Bugatti, Nissan, Audi, Lotus හා Ford සාර්ථක ලෙස four-wheel-drive



ධාවන මෝටර් රථ අතර අනසක පැතිරවීමට සමත් වෙනවා. ඒ අනුව මුල්ම 4WD සහිත Formula 1 මෝටර් රථය Ferguson P99 Climax ලෙස හැඳින්වෙයි.

ධාවන තරග සඳහා වූ four-wheel-drive මෝටර් රථවලින් වලින් සීමානොවුනු අතර, heavy truck රථ සඳහාද, බැකෝ ලෝඩර් වැනි ඉදිකිරීම් ක්ෂේත්‍රට සඳහා යොදා ගන්නා යන්ත්‍ර සඳහා 4x4 යොදාගැනීම සිදුවෙනවා. පසුව යුධකටයුතු සඳහාද යොදාගන්නා මෝටර් රථවලට 4x4 අන්තර්ගත වන අතර ලෝකය පුරා සීඝ්‍රලෙස 4X4 ජනප්‍රිය වීමට පටන් ගත්තේය.

## 4x4

4x4 හි මුල් 4 සංඛ්‍යාව මගින් රෝද ගණන නිරූපණය වෙයි. දෙවැනි 4 සංඛ්‍යාවෙන් යොදන බලය (එනම් එන්ජිම මගින් ඇක්සලයේ දෙකෙලවරට සම්ප්‍රේෂණය කරන ව්‍යාවර්ථය (torque)) නිරූපණය වෙයි. උදාහරණ ලෙස 4x2 යනු රෝද හතරේ වාහනයක් වන අතර එයින් රෝද දෙකකට පමණක් බලය සැපයෙයි. එනම් එක් ඇක්සලයක දෙකෙලවරට බලය සැපයෙයි.





එය ඉදිරි පස රෝද දෙකට සම්ප්‍රේෂණය (transmits) වන්නේ නම් front-wheel drive ලෙසද, පසුපස රෝද දෙකට සම්ප්‍රේෂණය වන්නේනම් rear-wheel drive ලෙසද හඳුන්වයි. තවත් උදාහරණයක් සලකන්නේනම්, 6x4 වාහනයක් ගමු. මෙහි රෝද 6ක් නැත්නම් ඇක්සල් 3කින් යුක්ත වෙයි. මෙහි ඇක්සල 2ක් මත torque එක බලපවත්වයි. එනම් රෝද 4ක් මත බලය සැපයෙයි.

## 4WD

Four wheel drive (4WD) ලෙස හඳුන්වන වාහනවල ඇක්සල 2 දෙකෙලවර torque එක ක්‍රියාකරයි. මෙය off-road ධාවනය සඳහා මෙය සංවර්ධනය කළ පද්ධතියකි. සාමාන්‍යයෙන් මෙවැනි මෝටර් රථවල 2WD (Two wheel drive) සිට 4WD (Four wheel drive) දක්වා මාරුකළ හැකි ස්විචයක්ද දක්නට ලැබෙයි. ඇතැම් මෝටර් රථවල මෙය ස්වයංක්‍රීයව (automatically) හෝ 'අතින් යෙදිය' (manually) හැකිය. මෝටර් රථය ගමන්ගන්නා මාර්ගයේ තත්ත්වය අනුව අවශ්‍ය පරිදි එය සකසා ගත හැකිය.

## AWD

All wheel drive (AWD) මෙහිදී මෝටර් රථයේ තිබෙන්නේ රෝද 4ද 6ද 8ද, ඒ සියලු රෝද සඳහා බලය සැපයීම සිදුවෙයි. එනම් ඒ සෑම ඇක්සල අවසානයට එන්ජිම මගින් torque එකක් ඇතිකරයි. වර්තමානයේදී මෙම AWD බර වාහන මෙන්ම සැහැල්ලු මගී වාහන සඳහාද යොදාගනියි. Off-road සඳහා මෙය වැඩිවශයෙන් භාවිත නොකරට මගී මෝටර් රථ සඳහා භාවිතකරනු දක්නට ලැබේ. එසේ සිදුකරනුයේ on-road traction ඇතුළු මනා ක්‍රියාකාරීත්වයක් ගොඩනැගීම සඳහාය. විද්‍යුත් මෝටර් රථ සඳහා All wheel drive තාක්ෂණය බැටරි ආරෝපණය කිරීම වැනි වෙනත් කාර්යයන් සඳහා යොදාගන්නා අවස්ථාද දක්නට ලැබේ.

## IWD

Individual-wheel drive (IWD) වැඩිවශයෙන් දක්නට ලැබෙන්නේ විද්‍යුත් මෝටර් (electric vehicles) රථවලය. මෙහිදී රෝද සඳහා වෙනවෙනම මෝටර් ස්ථාපිත කර තිබේ. ඒ නිසා මෙම මෝටර් එකිනෙකට 4WD වැනි විවිධ ගුණාංග අඩංගු කර තිබේ. අඟහරු ගවේෂණය සඳහා යොදාගන්නා Mars Rovers යානය 6-wheel IWD වෙයි.

all-wheel drive මෝටර් රථවල high හෝ low ලෙස ගියර් දක්නට නොමැති අතර Four-wheel drive මෝටර් රථවල high හෝ low ලෙස manual ආකාරයෙන් ක්‍රියාකරන ගියර දක්නට ලැබේ. මෙහිදී low ගියරයේදී වැඩි torque එකක් නිපදවන අතර එමගින් ඇදීම් හෝ Off-road සඳහා භාවිත කළ හැකිය. High ගියරය ලිස්සන සුලු අවස්ථාවක භාවිත කරයි.




# Aston Martin නිර්මාණය කළ 1,000hp/ton යතුරුපැදිය

# AMB 001

Kalum V. Sampath

Aston Martin සමාගම විසින් යතුරුපැදියක් පිළිබඳ තොරතුරු පසුගිය වසර අවසානයේදී හෙළිදරව් කළා. චිත්‍රපටවල දක්නට ලැබෙන යතුරුපැදි හැඩයකින් යුක්ත මෙය Aston Martin සමාගමේ විශිෂ්ට නිමාව, හැඩය මෙම යතුරුපැදියටත් ආරෝපණය කර තිබේ. Aston Martin මෝටර් රථවල එන සුඛෝපභෝගී බවක් එයින් ආරූඪ කර ගැනීමට සමාගම පියවර ගෙන තිබේ.







AMB 001 නමින් නම් කළ මෙම යතුරුපැදිය නිර්මාණයට Aston Martin සමාගම මෙන්ම Brough Superior සමාගම් එක්වී තිබේ. එනම් Aston Martin හි ඩිසයින් එක හා Brough Superior සමාගමේ ඉංජිනේරුවන් විසින් නිර්මාණය කර තිබේ. ඒ කියන්නේ දැවැන්ත, පෞරාණික වෙළෙඳ සමාගම් දෙකක එකතුවකින් මෙය නිර්මාණය වී තිබෙනවා.

මෙම සමාගම් දෙකේ නව සහයෝගීතාව යටතේ AMB 001 යතුරුපැදි 100ක් වැනි සීමිත සංඛ්‍යාවක් පමණක් නිර්මාණය කරනු ලබයි. සැහැල්ලු, නවීන, අද්විතීය, බලගතු යතුරුපැදියක්වන මේ සඳහා විශේෂ තාක්ෂණයන් එක්කර තිබේ.  AMB 001 යතුරුපැදිය 1000cc (DOHC 997cc) ධාරිතාව සහිත 8-Valve 88-dergree V-twin turbo-charged එන්ජිමකින් යුක්ත වෙයි. තවද එය 34 kW (180 hp) ක turbo-charged output එකක් ලබාදෙයි. මෙම turbo configuration තත්ත්ව මගින් ඇදහිය නොහැකි ප්‍රතිචාරයක් එන්ජිම



**Transmission**

extractible 6 speed gearbox

APTC Clutch,

final drive by chain.



මගින් ලබාදෙයි. Brough Superior සමාගම පවසන්නේ මෙවැනි දෙයක් Brough Superior මාදිලියකට එක්කරන මුල්ම අවස්ථාව බවයි.

මෙම යතුරුපැදිය 180kg අශ්වබල 180 බලයක් උත්පාදනය කරයි. එනම් බලය හා බර අතර අනුපාතය සැලකීමේදී ලොව වේගවත්ම මෝටර් රථයක් වන Koenigsegg One:1 හි 1,000hp/ton හි බලයට සමාන බලයක් මෙම යතුරුපැදිය උත්පාදනය කරයි.

තවද මෙහි විශේෂත්වය වන්නේ දෑතින් නිර්මාණය කිරීමයි. එරට බදු සහිතව (20% VAT) මෙහි මිල යුරෝ



Turbo

Turbo supercharging is an exclusive feature on a serial production motorcycle.







**Engine**

DOHC 997cc

8-Valve 88-dergree

V-twin, Water

Oil cooled,

Short stroke measuring 94mm x 71.8mm





108,000ක් පමණ වෙනවා. ඒ කියන්නේ ලංකාවේ මුදලින්නම් කෝටි 2කටත් වැඩියි. ලිමිටඩ් එඩිෂන් නිසාත්, මිලෙහි බරපතල කම නිසාත් ලංකාවේ නීති පද්ධතිය නිසාත් ඇතැම් විට මෙය මෙරට දැකගත නොහැකි වෙයි.

## Body

The body parts are fully made from carbon fiber, even when non-visible on the painted parts. Some of the body parts are structural and are allowing weight reduction.



UPCOMMING

# සැතපුම් 517ක දුරක් ධාවනය කළ හැකි නවතම රථය

# LUCID AIR













Dilhan Dhanushka

වර්තමානයේදී විද්‍යුත් මෝටර් රථ තරඟය උග්‍ර අතට හැරෙමින් තිබේ. ඒ ඒ සමාගම් අනෙකුත් සමාගම්වලට නොදෙවැනි තරගයක් ලබා දෙමින් සිටියි. මින් පෙනී යන්නේ මෝටර් රථ ක්ෂේත්‍රයේ අනසක පතුරවමින් සිටි සමාගම්වලට අලුත් සමාගම්වලින් එල්ලවන අභියෝගය සුළුපටු නොවන බවයි. එවන් සමාගමක් ලෙස Lucid Motors හඳුන්වන්න පුළුවන්. 2007 අගෝස්තු 22 වැනිදා කැලිෆෝනියාවේදී ආරම්භ කළ මෙම සමාගම වසර 13කට පසු ටෙස්ලා වැනි අති දැවැන්ත සමාගම්වලට සෘජු බලපෑමක් එල්ල කළ හැකි මට්ටමකට අද පත්වී තිබේ. ඒ සිය නිෂ්පාදනවල වූ ගුණාත්මක බව හා තාක්ෂණයෙන්. ලෙස Lucid Motors හඳුන්වාදුන් නවතම රථය Lucid Air ගැන මේ දිනවල බොහෝ දෙනා කතා කරයි.

විද්‍යුත් sedanමාදිලියේ මෝටර් රථයක් වන මෙය Tesla's Model S රථයට කරට කර තරග වැදීමට හැකි බව නිෂ්පාදකයන් පවසයි. ඒ නිසා මෙහි අන්වර්ත නාමය  වූයේ Tesla killer යන්නයි. මේ රථය දුටු විට අති සුඛෝපභෝගී බවක් දිස්වෙයි. Final product එකසියුම් විදිහට නිමවා තිබෙනවා. Lucid සමාගම මෝටර් රථ ක්ෂේත්‍රයේ පළපුරුදු නිෂ්පාදකයෙකු ලෙස එයින් සපථ කරනවා. 2021දී වෙළෙඳ පොළට පැමිණීමට මෙම මෝටර් රථය නිෂ්පාදනය කිරීම සඳහා Lucid හි ඇරිසෝනා කර්මාන්ත ශාලාව සූදානමින් සිටිනවා.

සැතපුම් කාලක දුරක් යන්න ගතවන්නේ තත්ත්පර 10 කාලයක් බවත්, 113 kWh ක battery capacity එකකින්ද, 900-volt system එකකින් යුක්ත බව වාර්තා වෙයි.





UPCOMMING









සැතපුම්517ක දුරක් ධාවනය කිරීමට හැකි බවත් පැවසෙයි. මෙම රථයේ Dream Edition මාදිලිය ඇ.ඩො.169,000ක් වැනි මුදලකට (බදු හැර) ලබන වසරේදී මිලදී ගත හැකිය. මෙම Dream Edition මාදිලියේදී ආසනය අංශක 45ක් අනත කිරීම, California-themed trims  හා සැතපුම් 503ක දුරක් ගමන් කළ හැකි වෙයි.

Grand Touring මාදිලියේදී සැතපුම් 517ක් දක්වා වූ දුරක් ධාවනය කළ හැකිය. එම මාදිලියත් ලබන වසරේදී ඇ.ඩො.139,000ක් වැනි මුදලකට මිලදී ගත හැකිය. 2022 දී වෙළෙඳ පොළට පැමිණීමට නියමිත මාදිලිය ඇ.ඩො.80,000ක් වැනි මුදලකට මිලදී ගත හැකි අතර එහි දුර ප්‍රමාණ පිළිබඳ තවම වාර්තා වී නැත.

Eureka Gold නම් විශේෂ වර්ණයකින්ද Dream Edition මාදිලිය වෙළෙඳ පොළට නිකුත් කරනු ලබයි. එය  21-inch AeroDream wheels, 1080 horsepower වලින් යුක්ත වෙයි. පැ.කි.මී. 0-60ක වේගයක් ලබාගැනීමට ගත වන්නේ තත්ත්පර 2.5ක පමණ කාලයකි.

2021 අවසානයේදී Air Touring මාදිලියක් වෙළෙඳ පොළට නිකුත් කිරීමට බලාපොරොත්තු වන අතර ඇ.ඩො.95,000ක මිලකට අලෙවි කරනු ඇත. එය සැතපුම් 406ක දුර ප්‍රමාණයක් ධාවනය කළ හැකිය.

සැතපුම් 300ක දුරක් ධාවනය කිරීමට මිනිත්තු 20ක් ආරෝපණය කිරීම ප්‍රමාණවත් වෙයි. Floating curved display හා Amazon's voice assistant Alexa මගින් බලගැන්වෙන infotainment systemද, facial recognition තාක්ෂණයද, expansive sunroof එක මෝටර් රථය විශේෂත්වයක් එක් කරයි. සුඛෝපභෝගී අමුද්‍රව්‍ය වලින් අභ්‍යන්තර උපාංග නිමවා තිබේ.

# SORRY TESLA!

## Tesla Model Yට අභියෝගයක් වන Electric compact SUV බලකාය

























Kalum V. Sampath

**Tesla Model Y කියන්නේ වර්තමානයේ ජනප්‍රියම Electric compact SUV එක. ටෙස්ලා සමාගමට Electric compact SUV ධාරාවේ අණසක පැතිරවීම තවදුරටත් ගැටලුවක් වී තිබේ. එනම් Ford, Nissan, Mercedes හා දැවැන්ත මෝටර්රථ සමාගම්වල සුපිරි පෙරළිකාරයන් කිහිපදෙනෙක් Tesla Model Y රඟදැක්වූ භූමියට පැමිණෙමින් තිබෙනවා. මේ අතරට අලුතින්ම එක්වූ Cadillac වැනි සමාගම්ද එක්වී තිබීම නිසා අනාගත අවුරුදු 2 තුළ Tesla Model Y ට දැඩි අභියෝගයක් එල්ල වනු ඇත. ඉතින් අපි අද කතාකරමු මොනවද මේ නවතම පෙරළිකාර Electric compact SUV මෝටර් රථ කියලා.**

## 1. Cadillac LYRIQ

සැතපුම් 300ක දුරක් ධාවනය කළ හැකි නවතම මෝටර් රථය තමයි Electric compact SUV යුද්ධයට අලුතෙන්ම එකතු වුණේ. අඟල් 33ක LED screen එකක් සහිත මෙහි General Motors' advanced driver system, Super Cruise, AR heads-up display වැනි නවීන විශේෂාංග රැසකින් සමන්විත වෙයි.

## 2. Ford Mustang Mach-E

Ford සමාගමේ 100%ක්ම විදුලි මුල්ම මෝටර් රථය මෙයයි. මෙහි මුල්ම මාදිලිය Mach-Es සීමිත නිෂ්පාදන සංඛ්‍යාවක් නිෂ්පාදනය කළ අතර, 2021 වසරේදී වෙළෙඳ පොළට නිකුත් කිරීමට නියමිතයි. අනෙක් මාදිලිය සැතපුම් 300ක දුරක් ධාවනය කළ හැකි අතර, Tesla-esque 15.5-inch touchscreen එකකින් යුක්ත වෙයි.

## 3. Fisker Ocean

2020 CES ප්‍රදර්ශනයේදී මුල්වරට ඉදිරිපත් කළේය. මෙය 2022 දී පමණ වෙළෙඳ පොළට ඉදිරිපත් කරන ඇ.ඩො.37,499ක් වැනි ආරම්භ මිලකට අලෙවි කිරීමට සූදානම්. මෙම රථයත් සැතපුම් 300ක් දුර ධාවනය කළ හැකිය. එපමණක් නොව Solar Roof, recycled materials වැනි විශේෂාංගවලින් යුක්ත වෙයි.

## 4. Mercedes EQC

Mercedes සමාගම සිය මුල්ම විද්‍යුත් මෝටර් රථය අණාවරණය කළේ 2018දීය. මෙම වසර අගවන තෙක් එය සැලසුම් කර නොතිබිණි. උපරිම වේගය පැ.සැ. 110ක්ද, සැතපුම් 280ක උපරිම දුරක් ධාවනය කළ හැකි මෙය AI හා voice recognition තාක්ෂණයෙන් බලගැන්වෙන MBUX control system එකකින් යුක්ත වෙයි. ඒ අනුව AI හා voice recognition වලින් සංගීතය රසවිඳීම, රථය තුළ කාලගුණය පාලනය කිරීම වැනි බොහෝ දේ සිදුකළ හැකිය. ඇ.ඩො.70,000කට මෙහි ආරම්භක මිල සටහන් වෙයි.

## 5. Nissan Ariya

Nissan Leaf රථයට සමානය. 2021 දී සුඛෝපභෝගී විද්‍යුත් මෝටර් රථ වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට නියමිත මෙය ඇ.ඩො.40,000ක් වැනි මුදලකට අලෙවි වෙයි. මෙම SUV රථය සැතපුම් 300ක දුරක් ධාවනය කළ හැකිය.

## 6. Byton M-Byte

චීන විද්‍යුත් මෝටර් රථ සමාගමක් වන Byton විසින් නිෂ්පාදනය කරන මෙහි අඟල් 48ක විශාල windshield screen එකකින් යුක්ත වෙයි. සැතපුම් 200ක දුරක් ධාවනය කළ හැකි අතර, ඇ.ඩො. 45,000කට අලෙවි කිරීමට සූදානම් වෙයි.

## 7. Mazda MX-30

එක් ආරෝපනයකින් සැතපුම් 124ක දුරක් ධාවනය කළ හැකි මෙම MX-30 රථය ලබන වසරේදී ජපානයේ හා යුරෝපීය වෙළෙඳ පොළ තුළ අලෙවි කිරීමට සූදානම් වෙයි.

## 8. Rivian R1S

ඇමෙරිකානු විද්‍යුත් මෝටර් රථයක් වන මෙය Model Y මාදිලියට වඩා මදක් රළු ගතියක් පෙන්නුම් කරයි. Surfboards, kayaks, skis වැනි උපාංග පහසුවෙන් ගෙන යාහැකි මෙහි ඉහළම මාදිලිය සැතපුම් 400ක දුරක් ධාවනය කළ හැකිය. ඇ.ඩො.69,000ක් වැනි මුදලකට අලෙවි කිරීමට බලාපොරොත්තු වෙයි.

## 9. Volkswagen ID.4

Volkswagen සමාගමේ විද්‍යුත් මෝටර් රථවල තවත් එක් කොටසක් ලෙස ID.4 මාදිලිය හඳුන්වා දුන්නේය. මෙම මුල්ම ID මාදිලි පෙළ ඇමෙරිකාවේදී මිලදී ගත හැකි අතර, නවතම ID.4 මාදිලිය චීනයේදී හා යුරෝපයේදී වෙළෙඳ පොළට නිකුත් කරනු ලබයි.

## 10. Volvo XC40 Recharge

2019 වසරේදී වෝල්වෝ සමාගම සිය මුල්ම විද්‍යුත් මෝටර් රථය හඳුන්වා දුන්නේය. ඇ.ඩො.48,000 කට අලෙවි කිරීමට සූදානම් මෙය සැතපුම් 200ක දුරක් ධාවනය කළ හැකිය.

මෙම මෝටර්රථවලට අමතර Porsche වැනි සමාගම්ද විද්‍යුත්SUV මාදිලියේ මෝටර් රථ නිෂ්පාදනයට උරදී තිබෙනවා. මේ අනුව ඉදිරියේදී තියුණු තරගයක් මෙම EV SUV මාදිලි වල දැක ගත හැකිය.



Jaguar Land Rover රථය ගැන අමුතුවෙන්ම කතා කරන්න දෙයක් නැහැ. මොකද, සෑම වාහන ලෝලියෙක්ම Land Rover රථය ගැනදන්නවා. ඒ වගේම තමන්ගේ සිහින වාහනය අතරට එකතුකර ගන්නත් අමතක කරන්නේ නෑ. අපි අද කතා කරන්නේ පරිසර හිතකාමී Land Rover රථයක් ගැන. මේ රථය පිළිබඳව Jaguar Land Rover මුල්වරට තොරතුරු හෙළි කරන්නේ මීට මාස දෙකකට පමණ පෙරයි. ඔවුන් පවසන පරිදි ඉදිරියේදී වෙනස් ආරක් ගැනීමට මෙම රථයට හැකි වෙයි.




UPCOMMING



# Jaguar Land Rover Hydrogen බලයෙන්?

මෙම Jaguar Land Rover රථයේ කැපී පෙනෙන විශේෂත්වය වන්නේ මෙය බලගැන්වෙන්නේ Hydrogen fuel cell වලිනි. ඒ කියන්නේ පෘථිවියේ බහුලවම පවතින මූලද්‍රව්‍ය වන හයිඩ්‍රජන් වලින් තමයි මෙය බලගැන්වෙන්නේ. හයිඩ්‍රජන් බලයෙන් ක්‍රියාකරන මුල්ම මෝටර් රථය මෙය නෙමෙයි. නමුත් හයිඩ්‍රජන් බලයෙන් ක්‍රියාකරන ලෝකයේ මුල්ම SUV මාදිලියේ මෝටර් රථය මෙයයි. Jaguar Land Rover සමාගම මෙම ව්‍යාපෘතිය නම් කර තිබෙන්නේ Project Zeus ලෙසයි. මෙය කාබන්



විමෝචනය අවම කිරීම සඳහා මෝටර් රථ අංශයට රජය විසින් අරමුදල් සපයන ලද පවුම් මිලියන 73.5 ක ව්‍යාපෘතියකි.

එරට රජය පවසන පරිදි fuel cell විදුලි වාහන සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමෙහි සැලකිය යුතු වර්ධනයක් සහ හැකියාවක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වන බවත්, එක්සත් රාජධානිය සඳහා බුද්ධිමය දේපළ හා සැපයුම් දාමයේ තරඟකාරී මායිමක් සැපයිය හැකි බවත් පෙන්වා දෙයි.

මෙම Project Zeus, ළදරු අවධියේ මේ වනවිට පවතින අතර, JLR, Delta Motorsport, Marelli Automotive Systems හා UKBIC යන සමාගම් 4ක දායකත්වයෙන් නිර්මාණය වෙයි. හයිඩ්‍රජන් බලයෙන් ක්‍රියාකරන Land Rover රථයක් මෙම වසර අගදී හෝ ලබන වසරේදී වෙළෙඳ පොළ තුළ දකින්නට ලැබෙනු ඇතැයි බෝහෝ දෙනෙකුගේ අදහස වන්නේ.


GENERAL TIRE



# දැවැන්ත රේසිං ක්‍රීඩා මාලා දෙකක නිල නාමය

FORZA



**මෝටර් රථ ධාවන ක්‍රීඩා ලෝලියෙකුනම් Need for speed වගේම Forza වීඩියෝ ක්‍රීඩා පිළිබඳ අනිවාර්යයෙන් දැනගත යුතුය. මක්නිසාද යත් මෙම ක්‍රීඩා දෙක මෝටර් රේසින් අතර ඉදිරියෙන්ම තිබෙන ක්‍රීඩා දෙකකි. Need for speed තරම් දිගු ඉතිහාසයක් නොමැති වුවත්Forza කියන්නෙත් දැවැන්ත වීඩියෝ ක්‍රීඩා මාලාවකි.**

Forza  කියන්නේ කලින් කියුවා වගේ මෝටර් රේසින් වීඩියෝ ක්‍රීඩා මාලාවක්. ඉතාලි භාෂාවෙන් Forza  කියන්නේ බලයයි. මෙය Xbox කොන්සෝල හා Microsoft Windows සඳහා නිපදවූ semi-sim racing video game එකක් වන අතර, Xbox Game Studios හරහා publish කරනවා.



Forza කියන්නේ දැවැන්ත රේසිං ගේම් මාලා දෙකක උල්පතක් කිව්වොත් නිවැරදියි. ඒ

1. Forza Motorsport
2. Forza Horizon

ඇමෙරිකානු වීඩියෝ ක්‍රීඩා සංවර්ධන සමාගමක් වන Turn 10 Studios හරහා Forza Motorsport මාලාවද, බ්‍රිතාන්‍ය වීඩියෝ ක්‍රීඩා සංවර්ධන සමාගමක් වූ Playground Games හරහා Forza Horizon ක්‍රීඩා මාලාව නිර්මාණය වෙනවා.

Xbox, Xbox 360, Xbox One, Xbox Series X හා Microsoft Windows යන Platformවලට නිර්මාණය කරන














මෙම Forza වීඩියෝ ක්‍රීඩා මාලාවේ පළමු වැන්න 2005 මැයි 3 වැනිදා නිකුත් කරනවා. ඒ Forza Motorsport ක්‍රීඩා මාලාව ආරම්භ කරමිණි. මේ දක්වා Forza Motorsport ක්‍රීඩා 7ක් එළිදක්වා ඇති අතර ඉදිරියේදී 8 වැන්න පැමිණීමට නියමිතයි.

2012 ඔක්තෝබර් 23 Forza Horizon වීඩියෝ ක්‍රීඩාව නිර්මාණය කරන අතර, 2018දී අවසන් ප්‍රධාන වීඩියෝ ක්‍රීඩාවක් වන Forza Horizon 4 හඳුන්වා දුන්නා. 2019දී Forza Street නමින් Spin-offs ක්‍රීඩාවක්ද එළිදැක්වුවා.

2005 Forza Motorsport ක්‍රීඩාව එළිදක්වා 2010 පෙබරවාරි වනවිට Forza වීඩියෝ ක්‍රීඩා පිටපත් මිලියන 10ක් ලොව පුරා අලෙවි විය. 2016 දෙසැම්බර් වනවිට එයින් ඇ.ඩො. බිලියනකට වඩා උපයාගැනීමට එම සමාගමට හැකියාව ලැබුණි. තවද 2016 දෙසැම්බර් වනවිට මිලියන 14කට අධික අද්විතීය ක්‍රීඩකයන් ප්‍රමාණයක් Forza community on Xbox One හා Windows 10 හරහා ලියාපදිංචි වී තිබේ.


19



SPORTS

# පාපැදි තරග



පාපැදියකින් වාර්තා කළ ඉහළම වේගය පැ.කි.මී. 268.831 (167.044 mph) කි. එකී වාර්තාව තබන ලද්දේ ෆ්‍රෙඩ් රොම්පල්බර්ග් විසිනි.



ෆ්‍රෙඩ් රොම්පල්බර්ග්

ප්‍රවාහන සේවයක් ලෙස, විනෝදය සඳහා, ව්‍යායාමයක් සඳහා හෝ ක්‍රීඩාවක් ලෙස පාපැදි ධාවනය සිදුකරයි. බොහෝ රටවල ප්‍රවාහන සේවාවක් ලෙස පාපැදි යොදා ගනියි. අඩු වේගයක් හා ඕනෑම ස්ථානයක පහසුවෙන් පැද යාහැකි වීම පාපැදි ජනප්‍රිය වීමට හේතුව වෙයි. යුරෝපය, ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය වැනි රටවල පාපැදි එදිනෙදා කටයුතු සඳහා බහුල වශයෙන් භාවිත කරයි.

## මුල්ම පාපැදි තරගය

1868 මැයි 31

**දුර ප්‍රමාණය** - මීටර් 31

**ස්ථානය** - සෙන්ට් ක්ලවුඩ්ස්, පැරිස්

**ජයග්‍රහණය** - ඉංග්‍රීසි ජාතික ජේම්ස් මූර්

(එම ජයග්‍රහණය කළ පාපැදිය එංගලන්තයේ ප්‍රදර්ශනයට තබා ඇත. එම පාපැදිය දැවවලින් සෑදූවත් වන අතර ලෝහවලින් ටයර නිමවා ඇත.)



ජේම්ස් මූර්





***පාපැදියක් පිළිබඳව මුල්වරට වාර්තා වන්නේ 1839 වසරේදීය. ස්කොට්ලන්ත ජාතික Kirkpatrick Macmillan විසින් නිර්මාණය කළ පාපැදිය ලොව මුල්ම පාපැදිය ලෙස සැලකෙයි.***



1980 පාපැදි තරගවල ස්වර්ණමය යුගය උදා විය. මෙහිදී විශාල පාපැදි ධාවන තරග පැවැත්විය. යුරෝපය, ඇමෙරිකාව හා එංගලන්තය වැනි රටවල පාපැදි තරග ව්‍යාප්ත විය. මෙම තරග නිසාම ලබාගත් ජනප්‍රියතාවය හේතුවෙන් ක්‍රීඩා පාපැදි සඳහා හොඳ වෙළෙඳ පොළක් නිර්මාණය විය. ඒ ඔස්සේ විවිධ පාපැදි නිර්මාණය විය. මාර්ගවල පාපැදි ධාවන තරග කණ්ඩායම් හෝ කේවල ලෙස පැවැත්විය. පසුව එය අදියර කිහිපයක් ඔස්සේ දිවෙන වෙනස් මාර්ගයන්ගෙන් යුත් ප්‍රදේශ දක්වා පාපැදි තරග ආරම්භ විය.



**ධාවකයන් 158 දෙනෙකු ආශ්‍රිතව සිදුකළ සමීක්ෂණ අනුව ධාවකයෙකුගේ තුවාල සිදුවීමේ ප්‍රවණතාව. බෙල්ල 48.8%, දණහිස 41.7%, ඉකිලි ප්‍රදේශය 36.1%, අත් 31.1% හා පිටුපස ප්‍රදේශය 30.3%**

## UCI (International Cycling Union)

ලෝකයේ පාපැදි තරග පාලනය කරනු ලබන සංවිධානය ලෙස UCI හඳුන්වයි. ස්විට්සර්ලන්තයේ ඒයිගල් හි මෙය පිහිටා තිබේ. 'ජාත්‍යන්තර පාපැදි සංගමය' විසින් පාපැදි ධාවනකරුවන් සඳහා විනය නීතිරීති පවත්වා ගැනීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබයි. තවද, කාන්තා හා පිරිමි ලෙස හෝ මහාමාර්ග, ධාවන පථ හා කඳුකර පාපැදි ධාවනය points ranking system මගින් වර්ගීකරණ කළමනාකරණය කිරීමද සිදුකරයි.


EUROPEAN TECHNOLOGY
ටයර්බාස්.lk
tyrebass.lk
ජංගම ටයර් සේවාව නිවසටම
SRI LANKA'S LARGEST ONLINE TYRE STORE